අධ්‍යක්ෂ ජනරාල්

Director General

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

Department of Animal Production and Health

Office

Web : www.daph.gov.lk


මගේ අංකය: DAPH/AD/20/3/6

දිනය: 2025.06.23

1. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
2. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - පශු සම්පත් අංශය
3. ප්‍රධාන ලේකම් (බස්නාහිර/මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ ඌව / සබරගමුව)
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/ සත්ත්ව අභිජනන/ පශු පර්යේෂණ/මානව සම්පත් සංවර්ධන/ සැලසුම් හා ආර්ථික/පශු ඖෂධ පනත් හා නීති ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
7. නාගරික කොමසාරිස්, (කොළඹ/ මහනුවර/ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ/ දෙහිවල- ගල්කිස්ස/ මොරටුව/ මීගමුව/ කඩුවෙල/ ගම්පහ/ යාපනය/ අනුරාධපුර/ අක්කරෙයිපත්තුව) මහ නගර සභාව

**<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2026</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/ET/4/3/5 හා 2011.12.22 දිනැති ලිපියෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ස්ථාන මාරු පරිපාටිය අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් 2026 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය/අංශය යටතේ ඇති සියලුම සේවා ස්ථාන වලට අනුයුක්ත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයට අයත් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් ස්ථාන මාරුවීම් අයදුම්පත් ආකෘති අංක 1 මගින් ලබාගෙන එම ස්ථාන මාරු පිළිබඳ ඔබගේ නිර්දේශ සඳහන් කර උපලේඛනයක් සකසා **2025.07.31** දිනට පෙර මා වෙත ලැබෙන්නට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2025.06.30 දින වන විට,

(I).

- අති දුෂ්කර සේවා ස්ථානයක (D) අවම වසර දෙකක සේවාවක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට

- දුෂ්කර සේවා ස්ථානයක (C) අවම වසර තුනක සේවාවක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට
- ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක (B) අවම වසර හතරක් සේවාවක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට

(II). එසේම ඕනෑම සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු/පළාත තුල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන්ම යටත් විය යුතුය.

03. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්/ එක් පළාතක් තුළ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් තමන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද යාමට අපේක්ෂිත සේවා ස්ථාන ආකෘති අංක II අනුව සඳහන් කර එම තොරතුරු අංශ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව නියමිත දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.

04. ඉහත 03 ඡේදයේ දැක්වෙන ආකෘති අංක II න් තොරතුරු ඉදිරිපත් කළ හා තොරතුරු ඉදිරිපත් නොකළ නමුත් එක් සේවා ස්ථානයක වසර 5 කට වැඩි සේවා කාලයක් සහිත/ එක් පළාතක් තුල වසර 10 ක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින්ගේ තොරතුරු ආකෘති අංක III හි දැක්වෙන උපලේඛනයකට අනුව නිවැරදිව සම්පූර්ණ කර නියමිත දිනට පෙර සහතික කර මා වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. (වැඩිම සේවා කාලයක් ඇති නිලධාරියාගේ නම මුලින් සඳහන් කර ඉතිරි නම් සේවා කාලය අනුව අනුපිළිවෙලට සඳහන් කරන්න.) අධ්‍යයන කටයුතු සඳහා අනුමත වැටුප් සහිත/රහිත නිවාඩු ලබා සිටින නිලධාරින්ගේ සේවා කාලය පහත සඳහන් පරිදි ගණනය කළ විට වසර 05 කට වඩා වැඩි වන්නේ නම් උපලේඛන අංක III ට ඔවුන්ගේ නම් ඇතුළත් කළ යුතුය.

- අනුමත වැටුප් සහිත නිවාඩු ලබා ඇති කාලසීමාව නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ අදාළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු ලැබේ. අනුමත වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාලසීමාව නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු නොලැබේ.

05. මෙම ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේදී උපයෝගී කොට ගන්නා ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/ET/4/3/5 හා 2011.12.22 දිනැති ලිපියෙන් අනුමත කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ස්ථාන මාරු පරිපාටිය හා සේවා ස්ථාන වර්ගීකරණය ද අංක I, II, III හා IV දරණ ආකෘති පත්‍රවල පිටපත් ද දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වන www.daph.gov.lk මඟින් බා ගත කර ගත හැක.

06. මේ සම්බන්ධයෙන් ඔබගේ අධීක්ෂණය යටතේ සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සියලුම නිලධාරින් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

07. ස්ථාන මාරු පරිපාටියේ 13 වන ඡේදය අනුව ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන:

| | | |
|---|---|---|
| (අ) | ස්ථාන මාරුවීම් අයදුම් පත් භාරගන්නා අවසාන දිනය | : **2025.07.31** |
| (ආ) | සේවා ප්‍රධානීන් තොරතුරු සැපයිය යුතු අවසාන දිනය | : **2025.08.07** |
| (ඇ) | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | : **2025.09.15** |
| (ඈ) | ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය | : **2025.09.30** |
| (ඉ) | අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | : **2025.10.31** |
| (ඊ) | වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු දිනය | : **2026.01.01** |

08. ඔබගේ අධීක්ෂණය යටතේ පවතින අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ/ අංශයේ 2025.06.30 දිනට පවතින /පැවතිමට නියමිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමට පහළ තනතුරුවල පුරප්පාඩු පිළිබඳ විස්තරද පහත දැක්වෙන ආකෘතියට අනුව සකස් කර **2025.08.07** දිනට පෙර ඉදිරිපත් කරන ලෙසට වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

| තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු | පුරප්පාඩුව පවතින ස්ථානය |
|---|---|---|---|---|
| | | | | |

Hemali Kothalawala

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:

1. ලේකම්, පශු සම්පත් විෂයභාර අමාත්‍යාංශය
   (බස්නාහිර/මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ ඌව /සබරගමුව)
2. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
   (බස්නාහිර/මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ ඌව /සබරගමුව)
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) කා.දැ.ගැ.ස.
   සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා
4. පළාත් අධ්‍යක්ෂ, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අ.කා.ස
   (බස්නාහිර/මධ්‍යම/ දකුණ /උතුර/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ ඌව /සබරගමුව)
5. ගරු ලේකම්, රජයේ පශු වෛද්‍ය නිලධාරින්ගේ සංගමය
6. ගරු ලේකම්, සත්ත්ව පාලන නිලධාරින්ගේ සංගමය
7. ගරු ලේකම්, වන ජීවී පශු වෛද්‍ය නිලධාරින්ගේ සංගමය